පාර්ලිමේන්තුවේ කථා පරිවර්තක (ඉංග්‍රීසි / දෙමළ/ ඉංග්‍රීසි )

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ඉහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2010.07.05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

1. වැටුප් පරිමාණය

වාර්ෂිකව රු. 274,620- 3x4380/13x6000-365,760/= වේ. (මෙම වැටුප් පරිමාණය මත දීමනා ද සහිතව අවම මාසික වැටුප ආසන්න වශයෙන් රු.45,200/= ක් පමණ වේ.)

පාර්ලිමේන්තු කථා පරිවර්තකයෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ විට, ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු කථා පරිවර්තක තනතුරට උසස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන අතර, රු.306,180- 5 x7740/8 x9480-420,720/= වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. (මෙම වැටුප් පරිමාණය මත දීමනා සමඟ අවම මාසික වැටුප ආසන්න වශයෙන් රු. 53,900/= ක් පමණ වනු ඇත.)

අවශ්‍යතාවයන් :

2. වයස් සීමාව

2010.07.05 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නිරත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. අධ්‍යාපන සුදුසුකම්

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී පහත සටහනේ දක්වා ඇති ආකාරයට අදාළ භාෂාවන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) (පැරණි නිර්දේශය) විභාගයේදී එකවර විෂයන් 04 ක් සමත් වී තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සටහනේ දක්වා ඇති ආකාරයට අදාළ භාෂාවන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

හෝ

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) (නව නිර්දේශය) විභාගයේදී එකවර විෂයන් 03 ක් සමත් වී තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සටහනේ දක්වා ඇති ආකාරයට අදාළ භාෂාවන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සටහන - ඉහත 3 (අ) (ඇ) (ඇ) යටතේ පහත සඳහන් ආකාරයට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

පාර්ලිමේන්තු කථා පරිවර්තක:-

ඉංග්‍රීසි / දෙමළ/ ඉංග්‍රීසි තනතුර සඳහා - ඉංග්‍රීසි හා දෙමළ භාෂා සඳහා

4. පළපුරුද්ද

ගුරු වෘත්තිය, කථා පරිවර්ථනය, භාෂා පරිවර්තනය ජන සන්නිවේදනය වැනි භාෂා ආශ්‍රිත ක්ෂේත්‍රයක ලැබූ පළපුරුද්ද අත්‍යාවශ්‍යය වේ.

(i) ඉහත 3 (අ) යටතේ අයදුම් කරන්නන්හට වසර 01 කට නොඅඩු සේවා පළපුරුද්ද තිබිය යුතුය.

(ii) ඉහත 3 (ආ) සහ (ඇ) යටතේ අයදුම් කරන්නන්හට වසර 04 කට නොඅඩු සේවා පළපුරුද්ද තිබිය.

වෙනත් තොරතුරු :

5. බඳවා ගැනීමේ පටිපාටිය

ක්ෂණික කථා පරිවර්තන හා භාෂා පරිවර්තනය පිළිබඳ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

සටහන - එක හා සමාන දක්ෂතාවයකින් හා පහසුවෙන් එක් භාෂාවක සිට අනෙක් භාෂාවට ක්ෂණිකව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අත්‍යාවශ්‍යය වේ.

6. සේවා කොන්දේසි

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම මූලිකව තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව සිදුකරනු ලැබේ. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්නරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් ගේ කාර්යය

මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසි වලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් , වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ / ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් ද දායකත්වය ලබා දිය යුතුය.

(iv) තෝරා ගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ ඇය පිළිබඳ ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම ද සිදු කරනු ඇත.

7. අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතුය. සහතිකවල මුල් පිටපත ඉදිරිපත් කළ යුත්තේ එසේ කිරීමට ඉල්ලා සිටින විට දී පමණි.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) වෘත්තියමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික
(ඉ) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්

(දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය / රජයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අයදුම්කරුවන් චරිත සහතික එවීම අවශ්‍ය නැත.)

8. රාජ්‍ය / පළාත් රාජ්‍ය / රජයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

9. කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ,සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2010 ජූනි මස 13 වැනි දින.